


තව දුරටත් රෝගය උත්සන්න වූ විට තමන්ගේ පවුලේ අයගේ නෑ කම් නම් අමතක වී යයි. උදාහරණයක් හැටියට තමන්ගේ දුව පුතා පවා හඳුනන්නේ නැති තත්වයට පත්වේ. සමහර අයට තමන් හොඳින් කතා කළ භාෂාවන් අමතක වෙයි.




**වෛද්‍ය පද්මා හේරත් MBBS**

Dementia රෝගය නොහොත් අමතක වීමේ රෝගය සුලබව දක්නට ලැබෙන රෝගයකි. මෙහිදී වනනේ මොලයේ මතකයට උපකාර වන ස්නායු සෛල පමනක් යම් යම් හේතූන් නිසා මිය යාමට පටන් ගැනීමයි. එනිසා මතකයට අදාල ක්‍රියාවලීන්ට පමණක් මේ රෝගය බලපායි. මේ අයගේ අනිකුත් ක්‍රියාවලි එනම් ඇවිදීම, කෑම ගිලීම, කතාව වැනි දේවල් රෝගය උත්සන්න කාලයේ දී පවා කරගැනීමට හැකියාව තිබේ.

Dementia රෝගයේ හේතුකාරක ගැන පලමුවෙන් සොයා බලමු. අපි කවුරුත් අසා ඇති Alzimers Dementia වලට හේතුව සොයා ගෙන නැහැ. එනම් මොලයේ සමහර ස්නායු සෛල කිසියම් අපල නොදන්නා හේතුවක් නිසා ක්‍රම ක්‍රමයෙන් විනාශ වෙයි.

Dementia වලට තවත් හේතු කාරකයක් වන්නේ මොලයේ ඉතා කුඩා රුධිර නාල වල පිපිරීමක් නිසයි. මෙය කොයි තරම් කුඩාද කිවහොත් රෝග ලක්ෂණ කිසිවක් දැකින්නට නොලැබේ. මේවා අවුරුදු ගණනාවක් තිස්සේ ඇතිවීමෙන් ක්‍රම ක්‍රමයෙන් මොලයට හානි පැමිණෙන නිසා ඩිමෙන්ෂියා රෝගය සෑදෙන බව සොයාගෙන ඇත. මේ Strokes වලටය නිශ්චිත හේතු සොයාගෙන නැති මුත් කාලයක් තිස්සේ අදික රුධිර පීඩනය පාලනය නොකර තිබීම, රුධිරයේ කොලෙස්ටරෝල් මට්ටම වැඩිවීම වැනි කාරණා හේතු වන බව විශ්වාස කෙරෙයි.

සමහර ස්නායු රෝග වලින්, එනම් multiple sclerosis, Parkinson desease, aids හා සමහර මොලයට වැළදෙන වෛරස් රෝග (Viral encephalitis) වැනි රෝග වලිනුත් ඩිමෙන්ෂියා රෝග තත්වය ඇතිවෙන්න පුලුවන්.

මොලයට වතුර එකතුවීම තවත් හේතුවක්. කාලයක් තිස්සේ මොලයට හානි වීම (බොක්සිං වැනි ක්‍රීඩා නිසා) මේ රෝග තත්වය ඇති වන බව සොයාගෙන තියෙනවා. මොහමඩ් අලි වගේ දක්ෂ බොක්සිං ක්‍රීඩකයාට ඩිමෙන්ෂියා රෝගය අඩුවෙන් ඇති වීම මේකට උදාහරණයක්.

ඊළඟට මෙහි රෝග ලක්ෂණ සලකා බලමු. මුලින්ම වෙන්නේ තමන් ළඟදී (මේක විනාඩි ගණනකට පෙර පැය හෝ දවස් කිහිපයකට පෙර වෙන්න පුලුවන්) කියපු කරපු සමහර දේවල් සම්පූර්ණයෙන්ම අමතක වීමයි. ඊළඟට මෙය නිතර නිතර සිදුවන්නට පටන් ගනියි. මේ අයට අවුරුදු ගණනාවකට පෙර සිදුවුණ දේවල් හොඳට මතකයේ තියෙනවා. ඊළඟට හිතා මතා තීරණ ගැනීම, ප්‍රශ්න නිරාකරණය කිරීමට තියෙන හැකියාව වගේ දේවල් වල අපහසුතාවක් ඇති වේ. ඊළඟට තමන් කලින් ගොස් ඇති තැන් නුපුරුදු හැටියට හැඟෙයි. ඒ තැන් වල සිට ආපසු ආ තැනට, විශේෂයෙන් පාර වල සොයා ගැනීම අපහසු වී අතරමං වෙන අවස්ථා ඇති වෙයි. තමන්ගේ ගෙදර නාන කාමරය හෝ කුස්සිය තියෙන තැන් සොයා ගැනීමට එහෙමත් නැත්නම් කෑම ලිප උඩ තබා උපන විට එය අමතක වීම ගෑස් කරාමය වැසීමට අමතක වීම වැනි දේවල් ඇති වෙන්නට පටන් ගනියි. සමහර අය ගෙවල් ඇතුලේ වෙනත් අය ඉන්නා බවක් විශ්වාස කරන්නට ගනියි.

තව දුරටත් රෝගය උත්සන්න වූ විට තමන්ගේ පවුලේ අයගේ නෑ කම් නම් අමතක වී යයි. උදාහරණයක් හැටියට තමන්ගේ දුව පුතා පවා හඳුනන්නේ නැති තත්වයට පත්වේ. සමහර අයට තමන් හොඳින් කතා කළ භාෂාවන් අමතක වෙයි.

මේ රෝගය සොයා ගන්න විශේෂ පරීක්ෂණයක් නැහැ. නමුත් සාමාන්‍ය අමතක වීම හා ඩිමෙන්ෂියා රෝගය වෙන් කර හඳුනා ගන්න පුලුවන්. මේ සඳහා කරන එක් පරීක්ෂණයකදී කෙරෙන්නේ මතක තබා ගැනීමේ හැකියාව, තේරුම් ගැනීමේ හැකියාව සොයා බැලෙන සියුම් ප්‍රශ්නවැලක් මගින් රෝගියා පරීක්ෂා කිරීම. සාමාන්‍ය අමතක වීම තියෙන කෙනෙකුට මේ ප්‍රශ්න වලට පහසුවෙන් උත්තර දෙන්න පුලුවන්. මේ ප්‍රශ්න වෙලට ලකුනු දීලා එමගින් ඩිමෙන්ෂියා රෝගය තියෙනවාද කියලා සොයා ගන්න පුලුවන්.

ඩිමෙන්ෂියා රෝගය සුව කරන්න බෙහෙතක් නැහැ. නමුත් රෝගය ඉක්මනින් උත්සන්න වන එක අඩු කරන්න බෙහෙත් වර්ග දෙකක් තියෙනවා. මේ බෙහෙත් වලින් රෝගය ටික කාලයකට මර්දනය කරන්න පුලුවන්.

ඩිමෙන්ෂියා රෝගියාට පමණක් නෙවෙයි. පවුලේ අනෙත් අයටත් මෙය හිතට ආතතියක් ගෙන දෙන ප්‍රශ්නයක්. ඒ නිසා මේ අවස්ථා වලදී රෝගියාට හා පවුලේ අයට උදව් උපකාර කිරීම අවශ්‍යයි. රෝගය ගැන හරි අවබෝධයක් දීම අවශ්‍යයි. මේ සඳහා ඕස්ට්‍රේලියාවේ ස්වෙච්ඡා සංවිධාන තියෙනවා. මේ සංවිදාන නොයක් උදව් උපකාර කරන්න සූදානම්. විශේෂයෙන් පැය කීපයකට රෝගියා බලා ගැනීම පවුලේ අයට නිවාඩුවක් ගත කිරීමට අවශ්‍ය නම් රෝගියා




## මගේ අදහස

### තවත් ගුවන් විදුලි රේඩියෝ තෝනයේ ගණිත ගැටලුව

මෙල්බන් හි එක්තරා සිංහල ගුවන් විදුලි වැඩ සටහනක් මෙහෙයවන්නන් මෙහි සිංහල ප්‍රජාව බුද්ධිමතුන් හා අමනයන් වශයෙන් කොටස් කිරීමේ ප්‍රයත්නයක් දරන බව පැහැදිළිය. ඊට අදාල වූ එක් අවස්ථාවක් මෙහි ලා දක්වමි.

දැනට සති කීපයකට පෙර වාර්ෂික රෝඩියෝතෝනය සති දෙකක වැඩ සටහන් තුලින් පවත්වනු ලැබීය. ඉන් දෙවන සතියේ වැඩ සටහනේ දී එය මෙහෙයවන පඬිවරු දෙදෙනෙක් රේඩියෝතෝනයට මුදල් ආධාර දෙන්නනස් හා නොදෙන්නන් ගැන විමර්ශණයක් කළෝ ය. එහිදී එක් පඬිතුමෙක් මෙසේ කියයි. අපේ වැඩ සටහන 30000 ක් පමණ දෙනා අහනවා. එයින් සියයට 70 ක් පමණ බුද්ධිමතුන්. ඒ අය අපට ආධාර කැනවා. ඉතිරිය කරන්නේ අපි කරන හැම දේම විවේචනය කිරීම. ඒ අය ශතයක් වත් දෙන්නේ නැහැ. ඉතින් මොවුන් බුද්ධිමතුන් / මෝඩයන් යනුවෙන් ජනතාව වර්ග කරන්නේ කුමන මිනුම් දණ්ඩකින්ද කියා වැටහෙනවා ඇත.

කෙසේ වෙතත් මෙහිදී මගේ විග්‍රහයද දක්වනු කැමැත්තෙමි. රෝඩියෝතෝනය අවසානයේදී මැදිරියේ රැස්ව සිටි පිරිස හුරේ දමා අත්පොළසන් දී විසිල් ගසා ඩොලර් 9000 ක් සඳහා ප්‍රතිඥා ලැබී ඇති බව දැන් වීය. මේ ඩොපර් 9000 න් ඩොලර්1000 ක් පමණ ව්‍යාපාරිකයන් සමිති සමාගම් වලින් ලද මුදලයි. ඉතිරි ඩොලර් 8000 සාමාන්‍ය වශයෙන් ඩොලර් 20 - 25 අතර වූ පුද්ගලික ප්‍රතිඥාවන් ය. ඩොලර් 20 බැගින් ගණන් ගත් විට ඒ අනුව මුදල් ද ඇත්තෙ 400 දෙනෙකු පමණි. එක් ප්‍රතිඥාවක් එක් පවුලකින් යයි සිතමු. එවිට මුදල් දී ඇති මුළු සංඛ්‍යාව 800 ක් වේ.

මගේ ප්‍රශ්ණය නම් අර කියු අසන්නන් 30000 න් 29200 ක් ශතයක් වත් නොදෙන්නේ ඇයි. යන්නයි. මෙයවත් නොතේරෙන අමනයන් කවුරුන් ද?

ඔබ පුවත් පතට ජය

(පාඨකයාගේ නම සහ ලිපිනය සපයා ඇත)